සමාජයක් යහපත් වන්නේ ඒ සමාජ යන්ත්‍රණය මෙහෙයවන දෑත් පිරිසිදු මෙන්ම ශක්තිමත් වුවහොත් පමණි. ඇත්ත යුක්තිය හා නීතිය සාධාරණත්වය වෙනුවෙන් තම යුතුකම් හා වගකීම් ඉෂ්ඨ කිරීමට දේශපාලකයන් බැඳේ නම් අප වාසනාවන්ත මිනිසුන් වනවා නිසැකය.

ඔස්ට්‍රේලියාව පුරා දුගඳ ගසා හමා යන තවත් සමාජ අසාධාරණයක් නම් සූදු කෙළීමය. සූදුව, ත්‍රස්තවාදය හා මත්කුඩු මෙන්ම සමාජය විනාශ කරන දැඩි මර්ධනයට ලක් කළ යුතු ක්‍රීඩාවකි. නමුත් දේශපාලකයන් තමන් කුමන දේශපාලන මතවාදයක් ප්‍රකාශ කළ ද එහි දී හැසිරෙන්නේ නම් අබිං කෑ ගොළුවන් සේ ය.
අප සමාජය කොතරම් ලෙස විනාශ කරමින් තිබෙනවාද යන්න ප්‍රකාශ කළොත් සමස්ත ජනගහනයෙන් ලක්ෂ 5 ක් සූදු අන්තුවෝ ය. මොවුන් සූදුව නිසා තම මුදල්, කණකර, රත්තරං ආයිත්තම් ඇතුළු තමන් සන්තකය විකුණා හෝ අනෙකෙකුගේ දෙයක් සොරකම් කර හෝ තම සිහින නිධානය සොයා යන අසම්මත මිනිසුන් ය. මොවුන් එකෙකුගෙන් අඩුම තරමින් පස් දෙනෙකු වත් දුක් විඳින බව සොයා ගෙන ඇත. මේ ඔවුනගේ බිරිඳ, දරුවන්, නෑදෑයන් හා හිතවතුන්ය. මේ අනුව අඩුම තරමින් ලක්ෂ 15 කට ආසන්න පිරිසක් සූදුව නිසා තම ජීවිත විනාශ කරගත් අය ලෙස සැළකිය හැකි ය. ආර්ථිකය බිඳ වැටීම තුළින් ජනිත වන අයහපත් පරිසරය තුළ පවුල් පද්ධතිය විනාශ වීම, ජීවිත කළකිරීම, මානසික බිඳ වැටීම, පලායාම හා ජීවිත විනාශ කිරීම් දැක ගත හැකි ය. වික්ටෝරියා ප්‍රාන්තයේ පමණක් දිනකට අඩුම තරමින් එක් පුද්ගලයකු වත් සූදුව නිසා අපට අහිමිව යන බව හෙළි වී ඇත. අවුරුද්දකට මිය යන ප්‍රමාණය 300 ඉක්මවයි. මෙවන් තත්වයක් තුළ මෙය ත්‍රස්තවාදයට වඩා බියකරු බව ස්ථිරය. මෙම සමාජ ධාරාවේ මානසික අසහනය පාලනය කරනු ලබන ප්‍රධාන ක්‍රීඩාව ෆුට් ක්‍රීඩාවයි. ෆුට් ක්‍රීඩාව තුළින් නගන හඬ සමාජය පුරා දෝංකාර දී ගලා යයි. ඔස්ට්‍රේලියන් ෆුට් ලීග් හි කළමණාකරු රිකී නික්සන් හා හිටපු ක්‍රීඩක ඩේවිඩ් ස්වවර්ස් ප්‍රකාශ කරන්නේ සූදුව නිසා රග්බි හෝ ෆුට් ක්‍රිඩකයන්ගේ මානසික ශක්තිය විනාශ වන බව ය. ඔවුනට අනුව අයථා ලිංගික සම්බන්ධතා, මත්ද්‍රව්‍ය හා මත්කුඩු වලට වඩා සූදු විනාශ කාරී ය. එසේ හෙයින් වහාම මෙයට පාලනයේ තිත තැබීමට කාලය පැමිණ ඇති බව ඔවුහු පවසති.

නමුත් අපේ අලස අලජ්ජී දේශපාලකයෝ සිතා මතාම හෝ ස්වේච්ඡාවෙන් එය මගහරිමින් සිටිති. නිව් සවුත් වේල්ස් හි පමණක් සූදුවෙන් ලැබෙන වාර්ෂික ආදායම ඩෝලර් බිලියන 1.5 කි. වික්ටෝරියාවේ එය ඩොලර් බිලියන 1.4 කි. ඔස්යොවේ ප්‍රධාන ප්‍රාන්ත දෙකේ ආදායම එසේ ය. නමුත් මේහි කාලකන්නි යතාර්ථය නම් සූදු ක්‍රීඩාවේ නිරත සංඛ්‍යාවෙන් 42% ක් ම සූදුවට ඇබ්බැහි වූවන් ය යන්නය.

මොවුන් ධන කුවේරයන් නොවුවහොත් මේ වියදම් කරන මුදල ගලා එන්නේ එක්කෝ තරුණ පරම්පරාව විනාශ කරන මත්කුඩු ජාවාරමිනි. නැත්නම් අහිංසක මිනිසුන් සාධාරණ ලෙස හම්බුකරන ලද සන්තකය සොරා ගැනීමෙනි. පසුගියදා ලාංකික පවුලක ගෙදර තිබූ සියළු වස්තුව සොරාගෙන ගොස් තිබුණි.

එසේ නම් කිසිම හිරිකිතයකින් තොරව මර නින්දේ පසුවන දෙශපාලකයන් අවදි වී කුමක් කියන්නේ ද යන්න විමසා බැලිය යුතු ය. වික්ටෝරියා ලිබරල් පක්ෂයේ නායක හා



# සූදුවේ දේශපාලනය

සාලිය ගලප්පත්ති

විපක්ෂ නායකයා වන රොබට් ඩොයිල් ප්‍රකාශ කරන්නේ පොකී මැෂින් ඉවත් කිරීම අමාරු වැඩක් බවයි. ඔහුගේ අනාගත අධ්‍යාපන ඇමති වික්ටර් ප්‍රකාශ කරන්නේ ද මේ සමාජ පිළිලය ඉවත් කළ නොහැකි බවයි.
එනමුත් පිට කොන්දක් හා ආත්මයක් ඇති ලිබරල් පක් පාර්ලිමේන්තු මන්ත්‍රී රොබින් කූපර් ප්‍රකාශ කරන්නේ මෙම සමාජ පිළිලය අතුගා දැමිය යුතු බවයි. ඔහු තව දුරටත් ප්‍රකාශ කරන්නේ අප සියල්ල එකා මෙන් නැගී සිට මිනිස් පවුරක් ගොඩ නගා මෙය විනාශ කළ යුතු බවත් එසේ නොවුවහොත් අප කාලාන්තරයක් තිස්සේ ආදරයෙන් සෙනෙහසින් ගොඩ නැගූ මිනිස් ලෝකය විනාශ වී අප සියළු දෙනාම විනාශ වනු ඇති බවත් ය.

පාලකයන් ඉඳහිට රූපවාහිණී දැන්වීම් හරහා අපට කියන්නේ -අනේ සූදුවට ඇබ්බැහි වන්නට එපා.. අනතුරුදායකයි.. ඔබට කරදරයක් නම් ඉක්මනින් සූදුවෙන් ඉවත්වන්නට උපදෙස් දෙන දුරකථන අංකය අමතන්න- කියා ය. එසේම ඔවුන් තව දුරටත් කියනනේ සූදු පොලවල ට දීප්තිමත් විදුලි බුබුලු දමන ලෙස අණ කර තිබෙන බවත් දුම්පානය නොකර විනීතව හැසිරෙන ලෙස දැන්වීම් පවා අලවා තිබෙන බවත් ය. මේ බලධාරීන් කියන්නේ තමන්ට එක් පැත්තක් පමණක් බැලිය නොහැකි බවයි. තම පක්ෂ වලට උදව් උපකාර කරන කෝටිපති ධන කුවේරයන් ආරක්ෂා කඛ යුතු ය. ඔවුන් යටතේ සොච්චම් පඩියක් ගන්නා සේවක පවුල් කීපයක රැකියා වැඩි කිරීමද වගකිව යුතු රජයක් ලෙස තම වගකීම බව ද රජය පවසයි. ඔට්ටු ඇල්ලීම පිළිබඳ ව වූ ආර්තික ඵලදායිතා කොමිසමේ වාර්තාව පසුගිය දා පීළි දක්වන ලදී. මේ වාර්තාව පෙන්වා දෙන්නේ සූදුවට හා එයට සම්බන්ධ රැකියා නියුක්තියට වඩා විශාල මුලදක් එය හා සම්බන්ධ සමාජ ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කිරීමට සිදුවන බවයි. මෙයට සමගාමීව එන්සක් ජනපද වාර්තාවක් හෙළිදරව් කරන්නේ රජය සූදුවෙන් ඩොලර් එකක් උපයන විට එයට සම්බන්ධ දමාජ ව්‍යසනයයන් වෙනුවෙන් ඩොලර් තුනක් වියදම් කිරීමට සිදුවන බවයි.

සැබැවින්ම සමාජ ව්‍යසනයකදී වගකිව යුතු රජයක් ලෙස ඉහත දත්ත පාදක කර ගනිමින් දැඩි හා නොවෙනස් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය. ඒ යටතේ පොකී මැෂින් නිකුත් කිරීම අත්හිටුවීම, සෑම පළාතකම හෝටල් හරහා ආරම්බ කර ඇති සූදු ව්‍යාපෘති ක්‍රමවත්ව දැඩි පාලනයකට හසු කිරීම, නවීන තාක්ෂණය උපයෝගී කර ගිනිමින් සූදු පොළකදී එක් පුද්ගලයෙකුට එක් පොකී මැෂිමක් පමණක් පරිහරණය කිරීමට සැළැස්වීම, එහිදී එය පරිහරණය කිරීමේ කාලය පැය බාගයකට සීමා කිරීම වැනි ක්‍රමවේද මගින් මෙය පාලනයක් සහිතව පවත්වා ගත හැකි ය. (බීමට ඇබ්බැහි වූ රියැදුරන් වෙනුවෙන් මෝටර් රථ වල සවි කරන සංවේදිතා උපකරණ හෙවත් හඳුනාගැනීමේ (ඇඟිලි සළකුණු) උපකරණ සවි කළ හැකි ය.)
ඔස්ට්‍රේලියා සමාජයේ ජීවත් වන වැඩිහිටියන්ට තම පාල්ව තනිකම හුදෙකලාව මකා ගත හැකි එක් ක්‍රමයකි සූදු ක්‍රීඩාව. එසේ හෙයින් මෙයට ඇබ්බැහි වූ පුද්ගලයන් එයින් ඉවත් කර සාධාරණ සමාජයක් නිර්මාණය කිරීම ගෞරවාන්විත රජයක යුතු කමකි. වගකීමකි.

මත්ද්‍රව්‍ය ප්‍රවාහණ ධාරාවේ ප්‍රධාන වාහක බලවේග වන්නේ සූදුවට ඇබ්බැහි වූ පුද්ගලයන්ගෙන් පැවත එන්නන්ය. මොවුන්ගේ සමස්ත පවුල් පද්ධතියම විනාශ වී

වික්ටෝරියා ප්‍රාන්තයේ පමණක් දිනකට අඩුම තරමින් එක් පුද්ගලයකු වත් සූදුව නිසා අපට අහිමිව යන බව හෙළි වී ඇත. අවුරුද්දකට මිය යන ප්‍රමාණය 300 ඉක්මවයි. මෙවන් තත්වයක් තුළ මෙය ත්‍රස්තවාදයට වඩා බියකරු බව ස්ථිරය.




ගොස් ය. ගෙවල් දොරවල් අහිමි වීමෙන් ඔවුන් මහපාරට වැටී ඇත. එසේ හෙයින් දරුවනගේ අධ්‍යාපනය විනාශ වී ඔවුන් වීදි දරුවන් ලෙස පාරට පැමිණ අවසානයේ ගණිකා මඩම් වලට හොඳ ඉල්ලුමකට විකිණෙන සරුවපිත්තල බඩු බවට පත්ව ඇත.
සමාජය සතු සමස්ථ හර පද්ධතීන් විනාශ වෙමින් පවතිද්දී අපේ ප්‍රධාන ආගමක් වන කිතු දහමේ නායක පූජක තුමන්ලා නිහඬ ය. ඔවුන් ගේ අදහස් ප්‍රකාශණ වලට පමණක් සීමා වී ඇත. මෙයට මූලික හේතුව වී ඇත්තේ යුරෝපය පුරා හමා යන ආගමෙන් ඉවත් වීමේ මෝස්තර රටාවට අනුකූලව දැයි යන්න පැහැදිළි නැත. කේසේ නමුත් දහමෙන් න්රාමාණය වන යහපත් දැක්ම සහ යහපත් සමාජ ක්‍රමය වෙනුවෙන් අදට වඩා විශාල මෙහෙයක් හෙට දිනයේ අවශ්‍ය වීම අනිවාර්ය ය.
අවසානයේ යහපත් සමාජයක් සඳහා යහපත් අරමුණු සහිත රජයක් අපට උවමනා ය. ඔවුන් නිර්මාණය කිරීම අපේ ගෞරවාන්විත යුතුකමකි. එම අරමුණු සහිත උදාර දේහපාලකයන් වෙනුවෙන් කඩේ යාමේ දැඩි අවශ්‍යතාවක් අපට ඇත. මන්ද අප යනු තව කිසිවකු නොවේ. අපේ සමාජය හා රට ය. සමාජය විනාශ වීම රට විනාශ වීම යි.

■

